**කඩුගන්නාව නගර සභාව.**
**මහනුවර දිස්ත්‍රික්කය.**
**-----------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන.
**-------------------**

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම.
**-------------------------------**

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, 2016 මාර්තු 31 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 මාර්තු 30 දින ද, විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2016 ජුලි 15 දින සභාවේ ලේකම්වරයාට යවා ඇත.

### 1.2 තත්ත්වාගණනය කළ මතය.
**------------------------------**

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2015 දෙසැම්බර් 31 දිනට කඩුගන්නාව නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම.
**----------------------------------------**

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු.
**---------------------**

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරණු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මාර්තු මස මැතිවරණ අත්තිකාරම් පියවීමේ දී, රු.78,836 ක පියවන ලද අත්තිකාරම්, රු.157,673 ක් ලෙස අත්තිකාරම් ගිණුමට බැර කර තිබුණි. මෙම වරද නිවැරදි කිරීම සඳහා අත්තිකාරම් ගිණුමෙන් රු.78,836 ක් ඉවත් කිරීම පමණක් කළයුතු වුවත්, එම ප්‍රමාණයෙන් අත්තිකාරම් ගිණුම හර කර සමුච්චිත අරමුදල් ගිණුමට ද බැර කර තිබුණි.

(ආ) ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුවෙන් බදු පදනම මත ලබා ගෙන පැරණි නගර සභා කාර්යාල පරිශ්‍රය පවත්වා ගෙන ගොස් තිබුණු ගොඩනැගිල්ල වෙනුවෙන් 2015 දෙසැම්බර් 31 දිනට එම දෙපාර්තමේන්තුවට ගෙවියයුතු රු.3,719,201 ක බදු මුදල, රු.913,955 ක් ලෙස ණයහිමියන් යටතේ දක්වා තිබීම හේතුවෙන්, රු.2,805,246 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පළාත් පාලන දායක විශ්‍රාම වැටුප් අරමුදලට ගෙවියයුතු රු.1,409,549 ක මුදල රු.1,273,667 ක් ලෙස ගිණුම්ගත කිරීම හේතුවෙන්, ණයහිමියෝ රු.135,882 ක් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ආයුර්වේද මධ්‍යස්ථානයේ පැවතී රු ක ඖෂධ තොගයේ රු.39,922 ක් වටිනාකම වූ ගිණුම්ගත කර නොතිබුණි.

(ඉ) දිරාපත් නොවන කසළ අළෙවියෙන් ලැබෙන ආදායම් අදාළ වර්ෂයන් හී ආදායම් ලෙස ගිණුම්ගත නොකර, ඉකුත් වර්ෂ 03 ක ආදායම් ණය මුදාලීම් නමින් ගිණුමකට බැර කර තිබූ අතර, සමාලෝචිත වර්ෂය අවසානයට එම ගිණුමේ ශේෂය වූ රු.643,115 ක් ශේෂ පත්‍රයෙහි සංචිත යටතේ දක්වා තිබුණි.

### 1.3.2 ලැබියයුතු ගිණුම්.

------------------

2015 දෙසැම්බර් 31 දිනට ලැබියයුතු ගිණුම් ශේෂ අයිතිම 07 ක එකතුව රු.9,381,346 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක කාලයක් ඉක්මවා තිබූ ගිණුම් ශේෂයන් හී එකතුව රු.2,969,643 ක් වී තිබුණි.

### 1.3.3 ගෙවියයුතු ගිණුම්.

------------------

2015 දෙසැම්බර් 31 දින ගෙවියයුතු වියදම් ණයහිමි ශේෂය රු.5,048,234 ක් වූ අතර, එයින් අවුරුදු 01 ක් ඉක්මවා තිබූ ශේෂයේ වටිනාකම රු.2,407,872 ක් වී තිබුණි.

### 1.3.4 විගණනය සඳහා සාක්ෂි නොවීම.

---------------------------------

ගිණුම් විෂයයන් 03 කට අදාළ තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරිම හේතුවෙන්, එකතුව රු.960,986 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

### 1.3.5 නීති, රීති හා රෙගුලාසී ආදියට අනුකූල නොවීම.

------------------------------------------------

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරික්ෂණය කරනු ලැබේ.

| | නීති, රීති හා රෙගුලාසී යනාදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | නගර සභා ආඥා පනත.<br>--------------------------<br>36(ඉ)(ii) උප වගන්තිය | i. විෂයභාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව ඉඩම් කැබලි 36 ක් බදු දී තිබුණි.<br>ii. නීත්‍යානුකූල ගිවිසුමකට එළඹීමකින් තොරව පොරොන්දු පත්‍රයක් මත ඉඩම් කැබලි 27 ක් බදු දී තිබුණු අතර, පොරොන්දු පත්‍රයක් හෝ නොමැතිව ඉඩම් කැබලි 09 ක් බදු දී තිබුණි.<br>iii. පොරොන්දු පත්‍රයේ 3 ඡේදය ප්‍රකාරව බදු ගැණුම්කරු ඉඩම තාවකාලික වගාවකට හැර අන් කිසිදු කටයුත්තක් සඳහා යොදා නොගතයුතු බව දක්වා ඇතත්, නිවාස ඉදි කිරීමට හා වාණිජ කටයුතු සඳහා යොදා ගෙන තිබුණි. |

**(ආ) ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**

| | |
|---|---|
| මු.රෙ.571(2) | රු.220,105 ක් වූ ඉකුත් තැන්පතු 92 ක් සම්බන්ධයෙන් කටයුතු කර නොතිබුණි. |

**(ඇ) චක්‍රලේඛ**

| | |
|---|---|
| 1995 දෙසැම්බර් 27 දිනැති අංක 95/9 දරන මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ ගිණුම් චක්‍රලේඛයේ 06 ඡේදය. | සේවය හැර ගිය හා ස්ථාන මාරු වී ගිය නිලධාරින් 05 දෙනෙකුගෙන් අය වියයුතු රු.325,781 ක හිඟ ණය ශේෂ අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

## 2. මූල්‍ය සමාලෝචනය.

### 2.1 මූල්‍ය ප්‍රතිඵල.

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.7,274,116 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.4,979,594 ක් වුයෙන්, මූල්‍ය ප්‍රතිඵලයේ රු.2,294,522 ක වැඩිවීමක් දක්නට ලැබුණි.

### 2.2 ආදායම් පරිපාලනය.

#### 2.2.1 ආදායම් රැස් කිරීමේ කාර්යය සාධනය.

ලේකම්වරයා විසින් සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | 2015.01.01 ට හිඟය | වර්ෂයේ බිල් කළ ආදායම | එකතු කළ ආදායම | | 2015.12.31 දිනට මුළු අය කලයුතු ප්‍රමාණය |
|---|---|---|---|---|---|
| | | | 2015.12.31 දිනට හිඟයෙන් එකතු කළ ආදායම | 2015 වර්ෂයේ බිල් කළ ආදායමෙන් එකතු කළ ආදායම | |
| | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 6,209,715 | 7,568,853 | 3,442,114 | 5,091,789 | 5,244,665 |
| බදු කුළී | 500,395 | 2,938,136 | 112,567 | 2,834,195 | 491,769 |
| බලපත්‍ර ගාස්තු | 18,500 | 1,210,220 | 5,000 | 1,196,720 | 27,000 |
| වෙනත් | 536,975 | 1,259,230 | 536,975 | 633,895 | 625,335 |

| | | | | | |
|---|---|---|---|---|---|
| ආදායම් | | | | | |
| උසාවි දඩ | 151,158 | 137,683 | 80,075 | -- | 208,766 |
| මුද්දර | 1,253,550 | 745,750 | 853,660 | -- | 745,750 |
| ගාස්තු | | | | | ----------- |
| එකතුව | | | | | 7,343,285 |
| | | | | | ======= |

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.7,343,285 ක හිග ආදායම් ශේෂයක් නිරීක්ෂණය විය.

### 2.2.2 වරිපනම් බදු

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 ජනවාරි 01 දිනට හිග වරිපනම් බදු ආදායම රු.6,209,715 ක් වූ අතර, 2015 දෙසැම්බර් 31 දින දක්වා බිල් කළ ආදායම රු.7,568,853 ක් විය. ඉකුත් හිගයෙන් රු.3,442,114 ක් හා බිල් කළ ආදායමෙන් රු.5,091,789 ක් අය කර ගෙන තිබූ අතර, ප්‍රතිශතයක් ලෙස එය පිළිවෙළින් සියයට 55 හා සියයට 67 ක් විය. ඒ අනුව, ආදායම් රැස් කිරීම දුර්වල මට්ටමක පැවතුණි.

(ආ) රජයේ ආයතන 10 කින් 2015 වර්ෂයේ අවසන් දිනට අය වියයුතු වරිපනම් බදු ශේෂය රු.648,158 ක් විය.

### 2.2.3 බදු කුළී.

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 1980 දෙසැම්බර් 31 දිනැති අංක 1980/ 46 දරන පළාත් පාලන කොමසාරිස්වරයාගේ චක්‍රලේඛයේ 02 ඡේදය ප්‍රකාරව, බදු පදනම මත ලබා දී ඇති කඩ කාමරවල මාසික කුළිය වසර 05 කට වරක් ප්‍රතිශෝධනය කර ආදායම් අය කර ගැනීමට කටයුතු කළයුතු වුවත්, සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 14 ක් හා නව වෙළඳ සංකීර්ණයේ කඩ කාමර 19 ක් 2002 වර්ෂයේ සිට දීර්ඝ කාලීනව බදු දී තිබී 2012 වර්ෂයේ දී කුළී සංශෝධනය කර තිබුණි. එසේ වුවත්, නව තක්සේරු වටිනාකම පදනම් කර ගෙන ගිවිසුම්වලට එළඹී නොතිබුණි.

(ආ) නව වෙළඳ සංකීර්ණයේ අංක 07, 10 හා 16 යන කඩ කාමර 03 බදු දීම සම්බන්ධයෙන් සභාව හා කඩහිමියන් අතර ඇති කර ගන්නා ලද කිසිදු නීත්‍යානුකූල ලියවිල්ලක් විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

### 2.2.4 උසාවි දඩ හා මුද්දර ගාස්තු.

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරින්ගෙන් 2015 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.208,766 ක් හා මුද්දර ගාස්තු රු.745,750 ක් ලැබියයුතුව පැවතුණි.

**2.2.5 දැන්වීම් පුවරු ගාස්තු**

---

2014 දෙසැම්බර් 05 දිනැති අංක 1892 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය ප්‍රකාරව ස්ථිර දැන්වීම් පුවරු සඳහා වර්ග අඩියකට රු.100 ක ගාස්තුවක් අය කළයුතු වුව ද, සභා බල ප්‍රදේශයේ ස්ථාපිත කර තිබුණු දැන්වීම් පුවරු 306 කින් රු.1,796,075 ක මුදලක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය.**

---

**3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා.**

---

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) කඩුගන්නාව සති පොළෙහි 2008 වර්ෂයේ සිට පවතින රු.252,827 ක් වූ හිඟ කඩ කුළී ශේෂය අය කර ගැනීම සඳහා මහනුවර දිසා අධිකරණයේ නඩුවක් පවරා තිබූ අතර, බදුකරුගේ දේපළ වෙන්දේසි කර, හිඟ මුදල අය කර ගන්නා ලෙස 2014 මැයි 07 දින නඩුවේ අවසන් තීන්දුව ලබා දී ඇතත්, සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දින වන විටත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) නගර සභාව සතු තානායම බදු දීම වෙනුවෙන් ස 2015 දෙසැම්බර් 31 දිනට ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් වෙතින් රු.624,435 ක මුදලක් අය වියයුතුව තිබුණි. ලංකා රෙස්ට් හවුස් ලිමිටඩ් ආයතනය සමග ඇති කර ගෙන තිබූ ගිවිසුමකට අනුව, සභාව වෙත අය වියයුතු රු.65,000 ක් වූ මාසික ගාස්තුව බිල් කර රු.624,435 ක් වාර්ෂිකව අය වියයුතු ගාස්තු ලෙස ගිණුම්ගත කර තිබුණි. එසේ වුවත්, 2014 සැප්තැම්බර් මස සිට එම ගාස්තු රු.48,750 ක් ලෙස අඩු කර එවා තිබූ අතර, ඒ පිළිබඳ සොයා බැලීමට හා බිල් කිරීමේ දී නිවැරදි වටිනාකම හඳුනා ගැනීමට හෝ කටයුතු කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 05 දිනැති අංක 1892 දරන ශ්‍රී ලංකා ජනරජයේ ගැසට් නිවේදනය අනුව, ත්‍රී රෝද රථ නවතා තැබීම ගාස්තු ලෙස ත්‍රී රෝද රථයකින් වාර්ෂිකව රු.1,200 ක ගාස්තුවක් අය කිරීමට තීරණය කර තිබුණි. එහෙත්, ත්‍රී රෝද රථ නවතා තැබීම සඳහා ඉඩ පහසුකම් වෙන් කර දී නොතිබීම හා අතුරු ව්‍යවස්ථා සම්පාදනය කිරීමට කටයුතු කර නොතිබූ නිසා, ත්‍රී රෝද රථ සඳහා බලපත්‍ර නිකුත් කර ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි.

**3.2 මෙහෙයුම් අකාර්යක්ෂමතා.**

---

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරී පනතේ 21 වගන්තිය ප්‍රකාරව සැළසුම් අනුමත කර ගැනීම සඳහා සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂ 02 ක් තුළ ලැබී තිබුණු ගොඩනැගිලි අයදුම්පත් 242 කින් අයදුම්පත් 224 ක් සඳහා අනුමැතිය ලබා දී තිබුණු නමුත්, අනුකූලතා සහතික නිකුත් කර තිබුණේ ඉන් අයදුම්පත් 17 ක් සඳහා පමණි.

**3.3 හඳුනාගත් අලාභ.**

---

සභාව සතු සුපිරි වෙළඳ සංකීර්ණයේ අංක 12 දරන කඩ කාමරය බදුකරු විසින් ආපසු සභාව වෙත භාර දී තිබුණ ද, නැවත බදු දීමට කටයුතු නොකිරීම නිසා, සභාවට රු.90,000 ක ආදායමක් අහිමි වී තිබුණි.

**3.4 බලය නොලත් ගනුදෙනු.**

---------------------------

ප්‍රාග්ධන වියදම් දැරීම සඳහා වාර්ෂික අය වැය ලේඛනයෙන් රු.2,750,000 ක ප්‍රතිපාදන වෙන් කර ගෙන තිබී, පසුව රු.4,880,200 ක ප්‍රතිපාදන මාරු කර ගෙන තිබුණි. එහෙත්, දරා තිබුණු සත්‍ය පිරිවැය රු.9,088,788 ක් වූයෙන්, අනුමැතියකින් තොරව රු.1,458,588 ක ප්‍රාග්ධන වියදම් දරා තිබුණි.

**4. යහපාලනය හා ගිණුම් කටයුතුභාවය**

--------------------------------------

**4.1 අයවැය පාලනය.**

------------------

**පහත සඳහන් කරුණු නිරීක්ෂණ කරනු ලැබේ.**

(අ) සමාලෝචිත වර්ෂය තුළ දී ආදායම් හා වියදම් විෂයයන් අතර ප්‍රතිපාදන මාරු කිරීමෙන් අනතුරුව ද, අයවැයගත හා තථ්‍ය ආදායම් විෂයයන් 14 ක සියයට 24 සිට සියයට 100 ඉක්මාව ද හා වියදම් විෂයයන් 56 ක සියයට 16 සිට සියයට 100 ඉක්මවා ද සැළකියයුතු විචලනයක් නිරීක්ෂණය වූයෙන්, අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) ආදායම් වියෂයයන් 08 ක් සඳහා ඇස්තමේන්තුගත රු.5,213,000 ක් වූ මුදලින් කිසිදු ආදායමක් ලැබී නොතිබු අතර, වැය විෂයයන් 17 ක් සඳහා සළසා තිබුණු රු.2,225,000 ක ප්‍රතිපාදනවලින් කිසිදු වියදමක් නොදරා සම්පූර්ණ ප්‍රතිපාදනයම වෙනත් වැය විෂයයන්ට මාරු කර තිබුණි.

**4.2 වත්කම් කළමනාකරණය.**

---------------------------

**නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්.**

--------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රු.598,000 ක් වටිනා වාහන හා යන්ත්‍රෝපකරණ අයිතම 06 ක් නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිතව පැවතුණි.

(ආ) 2015 පෙබරවාරි මස පරිත්‍යාග වශයෙන් සභාව වෙත ලැබී තිබුණු පිළිවෙළින් රු.17,649,179 ක් හා රු.7,967,144 ක් වටිනා බැකෝ යන්ත්‍රය හා වයිබ්‍රේටින් රෝල සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් කිසිදු කාර්යයක් සඳහා යොදා නොගෙන නිෂ්ක්‍රීයව තබා තිබුණි.

**5. පද්ධති හා පාලනය.**

---------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අභ්‍යන්තර පාලනය
(ඇ) ආදායම් පරිපාලනය
(ඈ) ණයගැති හා ණයහිමි පාලනය